294

RARE

# ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය ලබන ආබාධිත ශිෂ්‍යයින් හට පුස්තකාල හා තොරතුරු සේවාවන් ලබා ගැනීමේ දී ඇතිවන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකි.

ටී. එන්. නෙයිසූරි



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 294 |
| ව අංකය | |



ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2002

# නිබන්ධ සාරාංශය

ඌන සංවර්ධිත රටක් වශයෙන් ශ්‍රී ලංකාව ආබාධිත ප්‍රජාව කෙරෙහි අවධානය යොමු කර ඇති ආකාරයන් හා එය කොතෙක් දුරට ප්‍රමාණවත් වී ඇත් දැයි ගවේෂණය කිරීම ත් මෙහි දී කර ඇති අතර ශ්‍රී ලංකාව අනිකුත් ජාත්‍යන්තර රටවල් අතර කිනම් තත්ත්වයෙහි ලා ආබාධිතයින් හට සැලකීමට පුරුදු පුහුණු වී ඇත් ද? යන්න ත් මෙහිලා කරුණු විමර්ශනය කර තිබේ.

වර්තමාන ශ්‍රී ලංකාව තුළ විවිධ අන්දමින් ආබාධිත වූවන් උදෙසා අවශ්‍ය ආධාරකයන් ලබා දීමේ දී මෙන්ම ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ දී ද අන්තර් ජාතික ප්‍රජාව හා සමග කිනම් මට්ටමක සිටී ද? යන්නත් කරුණු විමසා ඇත.

විශේෂයෙන්ම මානසිකව හැර අන් සියලුම ආකාරයෙන් ආබාධිත වූ තෘතීයික අධ්‍යාපනය ලබන පිරිස් කෙරෙහි දැඩි අවධානයක් යොමු කර පුස්තකාල භාවිතා කරන ආකාරය ත්, ඒ සඳහා ඔවුන්ට හිමි වරප්‍රසාද මොනවාද? පහසුකම් මොනවාද? අඩුපාඩු මොනවාද යන්න ත්. විමසීම විශේෂ අවධානයට ලක් වූ කරුණුය.

මෙහිදී සාමාන්‍ය හෙවත් මෙතෙක් ආබාධ නොවූ හා ඉදිරියේ දී ආබාධයට ලක් විය හැකි ප්‍රජාව කෙරෙහි ද තම ජීවිතයන් හි වටිනාකම මෙන්ම ඉන් සමාජයට ඉටු කල හැකි සේවාවන් පිළිබඳ ව හා ජීවිතයන් හි යථාර්ථය පිළිබඳ ව මඳක් සිතීමට මෙය තෝතැන්නකි.

ආබාධිත ප්‍රජාව කෙරෙහි සානුකම්පිතව නෙත් යොමු කිරීමට වඩා උතුම් කාර්යය වනුයේ ඔවුන් සමානත්වයෙහි ලා සැලකීම බව ද මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ.

මෙම අධ්‍යයනයේ දී ආබාධිත ප්‍රජාව හට ඇති යටිතල පහසුකම් හා සේවාවන් පිළිබඳ ව විමර්ශනය කර ඇති අතර ඇතුත් ශ්‍රී ලංකාව වැනි රටක පවතින ආර්ථික තත්ත්වය හමුවේ ගෝලීයකරණය කරා අත්වැල් බැඳ

ගනිමින් සමානව ගමන් කිරීමේ හැකියාවක් අල්පමාත්‍රයකින් හෝ පවතින බවට සැනසීමට පත් විය හැක්කේ දැනටමත් සමාජ සේවා අමාත්‍යාංශය මගින් ඒ සඳහා අදාල පියවරයන් ගෙන තිබෙන නිසාය. ඒ අනුව ආබාධිත ප්‍රජාව කෙරෙහි නිම විය යුතු යටිතල පහසුකම් හා සේවාවන් පිළිබඳ ප්‍රමිති අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබීම ම ඉතාමත් ම වැදගත් වූ සුභදායී ලක්ෂණයකි. එමගින් නුදුරු අනාගතයේ දී ආබාධිත ප්‍රජාව කෙරෙහි නව දුරටත් ඇඟයීමට ලක් වන අන්දමින් සැලසුම් ක්‍රියාත්මක වනු ඇත.

විශේෂ අධ්‍යාපනය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කර ඇති අතර එහි මෑත කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව ද විමසීමක් කර ඇත. එමෙන්ම ආබාධිතයන් උදෙසා පුස්තකාල පහසුකම් කොවුදු ආකාරයට සැලසී තිබේ ද? තවදුරටත් ඒවා කුමන ආකාරයකට වැඩි දියුණු කල යුතු ද? වැනි කරුණු ගෙන හැර පා ඇත.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාව වැනි ඌන සංවර්ධිත රටක ඔවුන් කෙරෙහි පවතින පුස්තකාල පහසුකම් හා සේවාවන් හි අඩු පාඩු හේතු කොට ගෙන ඇති වන්නා වූ ව්‍යසනයෙන් මිදීමට අවශ්‍ය නිගමන හා යෝජනාවන් ලුහුඬින් දක්වා ඇත.